# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1782/41 - 2012 නොවැම්බර් මස 02 වැනි සිකුරාදා - 2012.11.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

උඩුදුම්බර ප්‍රාදේශීය සභාව

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) වැනි උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියේ (vii) උප වගන්තියේ (ඌ) ඡේදය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව උඩුදුම්බර ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 දරන පළාත් සභා ආනුෂංගික විධිවිධාන පනතේ 2 වැනි වගන්තිය (1) වැනි උපවගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාතේ සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව උඩුදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බල පවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යවරයා විසින් සම්පාදනය කරන ලද 1988.08.23 වැනි දිනැති අංක 520/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථා වල අංක 06 දරන රථවාහන නවතා තැබීම සඳහා වන සම්මත අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දින සිට උඩුදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වීම පරිච්ඡින්න කරනු ලැබූ බවත් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව උඩුදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බලාත්මක නොවන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,<br>
මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍ය හා<br>
පළාත් පාලන විෂය භාර අමාත්‍ය.

2009 අගෝස්තු මස 14 වැනි දින,<br>
මහනුවර,<br>
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,<br>
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

1A - PG 001427— 425 (2012/11)

## කුලී රථ වාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

### *උඩුදුම්බර ප්‍රාදේශීය සභාව*

01. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය සමග කියවිය යුතු 126(vii)(ඌ) වගන්තිය ප්‍රකාර ලැබී ඇති බලය මත මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

02. මෙම අතුරු ව්‍යවස්ථාව උඩුදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කුලී රථ වාහන නවතා තැබීම, පාලනය කිරීම, විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම සඳහා වූ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

03. මෙම අතුරු ව්‍යවස්ථාව අමාත්‍යවරයා විසින් අනුමත කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත්කළ දිනයේ සිට ක්‍රියාත්මක වන්නේ ය.

04. ප්‍රාදේශීය සභාව විසින් අනුමත කර සභාපතිවරයා නියම කරනු ලබන මෙහි පළමු උපලේඛණයේ දැක්වෙන ස්ථාන වල හැර වෙනත් කිසිදු ස්ථානයක කුලී මෝටර් රථයක් කුළියට ධාවනයේ යෙදවීමේ අරමුණ ඇතිව නවතා තැබීම සිදු නොකළ යුතු ය. සභාවේ යෝජනා සම්මුතියක් මගින් නව ස්ථාන නම් කරනු ලැබිය හැකි ය.

05. උඩුදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ තුන්වන අතුරු ව්‍යවස්ථාවට අනුකූලව පළමු උපලේඛනයේ සඳහන් ස්ථාන වල දෙවන උපලේඛනයේ දැක්වෙන ගාස්තුවක් සභාවට මාසිකව ගෙවීමෙන් එකී ස්ථාන වල කුලී රථවාහන නවතා තැබීම කළ යුතු ය. එම ගාස්තුව සභාව වරින් වරට පනවනු ලබන යෝජනා සම්මතයක් මගින් තීරණය කරනු ලැබිය හැකි ය.

06. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන තැනැත්තෙකුගෙන් ලබාගත් බලපත්‍රය යටතේ හැර කිසිදු තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මෙහි පළමු උපලේඛණයේ දැක්වෙන ස්ථාන වල (සංශෝධන ද ඇතුලත්ව) කුලී මෝටර් රථයක් පෙ. ව. 5.00 - ප. ව. 9.00 දක්වා කාලය තුළ නවතා තැබීම නොකල යුතු ය.

07. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම සභාපතිවරයා විසින් හෝ බලය පවරනු ලබන තැනැත්තෙකු විසින්න හෝ කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස එය නිකුත් කරනු ලැබුවේ යම් මාසයක් වෙනුවෙන් ද ඒ මාසයේ අවසන් දිනයෙන් එහි වලංගු කාලය අවසන් වේ.

08. බලපත්‍රයක් ලබා ගැනීම සඳහා තුන්වන උපලේඛනයේ දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රයක් උඩුදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයෙන් ලබාගත හැකි අතර, බලපත්‍රයක් සඳහා වන සෑම ඉල්ලුම්පත්‍රයක්ම සභාපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. සභාපතිවරයා විසින් ඉල්ලා සිටිනු ලබන සියළු තොරතුරු ඉල්ලුම්පත්‍රයේ ඇතුළත් කළ යුතු ය.

09. කුලී රථ වාහන නවතා තැබීමේ ස්ථානයක නවතා තැබූ වාහනයක් අයිතිකරු හෝ රියදුරු වෙත එම වාහනය සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබූ අවසර පත්‍රය ඉදිරිපත් කරන ලෙස පොලිස් නිලධාරියෙකු හෝ රථ වාහන පාලකයෙකු හෝ තත් සඳහා සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් ඉල්ලනු ලබන කවර හෝ අවස්ථාවක එම අවසර පත්‍රය පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

10. සෑම මසකම පළමුවන දිනයට පෙර වාහන නවතා තැබීමේ බලපත්‍රය ලබාගෙන තිබිය යුතු ය. එක්වරකට නිකුත් කරනු ලබන්නේ එක මසකට පමණක් වලංගු වන බලපත්‍රයක් පමණි.

11. වාහනයක් කුලී රථ වාහන නැවතුම්පලට ඇතුළත් කිරීමට පෙර ඒ සඳහා අයදුම්පතක් සභාවට ඉදිරිපත් කර අවසර පත්‍රයක් ලබාගෙන වාහනය ඇතුල් කිරීම කළ යුතු ය.

12. ස්ථිර වශයෙන් මෙම නැවතුම්පල වලින් වාහනයක් ඉවත් කර ගන්නේ නම් හෝ අළුත්වැඩියාවන් සඳහා සති දෙකකට වඩා වැඩි කාලයක් තාවකාලිකව වාහනය ඉවත් කර ගන්නේ නම් ඉවත් කරගත් වහාම මෙම කාර්යාලයට ඒ බව දැන්විය යුතු ය. එසේ දැන්වීමක් නොකළ හොත් අදාළ මාසික ගාස්තුව ගෙවිය යුතු ය.

13. කුලී රථ වාහන නැවතුම්පල තුළදී කිසියම් වාහනයක් අළුත්වැඩියා කිරීම නොකල යුතු අතර, අනෙක් වාහන වලට අවහිරයක් ඇති නොවන පරිදි වාහන නැවැත්වීම කළ යුතු ය.

14. කුළී රථ වාහන නවතා තැබීමේ ස්ථානයක් තුළ නවතා ඇති වාහනයක් කිසිවකු විසින් සේදීම වෙනත් අයෙකු ලවා සේදීමට සැලැස්වීම හෝ නොකළ යුතු ය.

15. යම් තැනැත්තෙකු කුළී රථ වාහන නවතා තැබීමේ ස්ථානයක් හෝ වාහනයක් ඇතුළත හෝ බීමත්ව අනිසි ලෙස හා අශෝභන ලෙස හැසිරීම හෝ හිරහැරයක් වනසේ හැසිරීම නොකළ යුතු ය.

16. ඉහත සඳහන් 1-14 දක්වා වූ කවර හෝ අතුරු ව්‍යවස්ථාවක් උල්ලංඝණය කරනු ලබන සෑම තැනැත්තෙක්ම වරදකට වරදකරු වන අතර, නිසිබලය ඇති අධිකරණයක් ඉදිරියේ වරදකරු කරනු ලැබීමෙන් පසුව රු. 750.00කට නොවැඩි දඩයකට යටත් විය යුතු ය. තවද එම වරද ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා හෝ සභාපතිවරයා විසින් බලය පැවරූ නිලධාරියකු විසින් ලිඛිත දැන්වීමක් බාරදීමෙන් පසු එම වරද දිගටම කරගෙන යන විටෙක එසේ කරනු ලබන සෑම දිනකම රු. 250.00ක දඩයකට යටත් විය යුතු ය. එම දඩ මුදල් ප්‍රාදේශීය සභාවේ සභා අරමුදලට බැර විය යුතු ය.

17. නිසි බලය ඇති අධිකරණයක් විසින් එම අධිකරණය විසින් නියම කරනු ලැබූ වෙනත් යම් දඬුවමකට අමතරව මෙම අතුරු ව්‍යවස්ථාව කඩ කිරීම සම්බන්ධයෙන් දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරද කරනු ලැබූ බලපත්‍රධාරියකුගේ බලපත්‍රය අවලංගු කිරීම නීත්‍යානුකූල වන අතර, එසේ අවලංගු කිරීම වෙනුවෙන් කිසිදු වන්දියක් ලැබීමට එම බලපත්‍රලාභියාට හිමිකමක් නොමැති විය යුතු ය.

18. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස

| | | |
|---|---|---|
| "සභාපතිවරයා" යන්නෙන් | - | උඩුදුම්බර ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද, |
| "සභාව" යන්නෙන් | - | උඩුදුම්බර ප්‍රාදේශීය සභාව ද, |
| "බලය පවරනු ලැබූ නිලධාරියා" යන්නෙන් | - | කුළී රථ නතර කරනු ලැබූ ස්ථානයේ අවසරපත්‍ර නිකුත් කරන උඩුදුම්බර ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියා ද, |
| "මෝටර්රථය" යන්නෙන් | - | මාර්ග වල පාවිච්චි කිරීම සඳහා අදහස් කරන ලද හෝ සකස් කරන ලද යාන්ත්‍රිකව පදවන යම් වාහනයක් අදහස් කෙරේ. ත්‍රීරෝද රථයක්, ලොරියක්, වෑන් රථයක්, ට්‍රැක්ටරයක්, කාර් එකක්, ට්‍රැක්රථයක්, අත් ට්‍රැක්ටරයක්, ලොතරැයි වාහන, සංචාරක වාහන |

**පළමු උපලේඛනය**

*සලකුණු කර ඇති ස්ථානය*

1. මැදිවක මංසන්ධිය
2. උඩුදුම්බර පොලීසිය අසල
3. රෝහල් මංසන්ධිය
4. සමූපකාරය ඉදිරිපිට
5. හුන්නස්ගිරිය - කෙවුල්ගම මංසන්ධිය
6. හුන්නස්ගිරිය - බඹරබැද්ද මංසන්ධිය
7. හුන්නස්ගිරිය ඉන්ධන පිරවුම්හල අසල

**දෙවන උපලේඛනය**

| | |
|---|---|
| වාහන ලියාපදිංචිය සඳහා | රු. 500 |
| ත්‍රීරෝද රථයක් සඳහා | රු. 100ක් මසකට |
| ලොරියක් සඳහා | රු. 100ක් මසකට |
| වෑන් රථයක් සඳහා | රු. 100ක් මසකට |
| ට්‍රේලරයක් සහිත හෝ රහිත ට්‍රැක්ටරයක් සඳහා | රු. 50ක් මසකට |
| කාර් එකක් සඳහා | රු. 50ක් මසකට |

**තුන්වන උපලේඛනය**

1. වාහනයේ වර්ගය හා අංකය :————.
2. අයිතිකරුගේ නම :————.
3. හැඳුනුම්පත් අංකය :————.
4. ලිපිනය :————.
5. රියදුරුගේ නම :————.
6. ලිපිනය :————.
7. වාහනය නවතා තබන ස්ථානය :————.
8. වාහනය පාවිච්චි කරනුයේ කුමන කාර්යයක් සඳහා ද :————.
9. එහි ධාරිතාව/ප්‍රමාණය :————.

:————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සභාපතිතුමාගේ නිර්දේශය

:————.
සභාපති

දිනය :————.

11-669

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.